My No: JSC/SEC/CIR – L/2025

**To all Judges and Judicial Officers,**

**Judges' Security**

Judicial Service Commission having considered an anonymous petition received on the subject referred to above, directed me to bring the same to the attention of all Judges and Judicial Officers in the light of circulars issued pertaining to the security of Judges.

Under the command of the Judicial Service Commission,

H.S.Somaratne
Secretary
Judicial Service Commission

H. Sanjeewa Somaratne
Secretary
Judicial Service Commission
Colombo 12

09th of January 2025
Office of the Judicial Service Commission Secretariat
Colombo 12.

ANNEXE A - Pet 16
JUDICIAL SERVICE COMMISSION SECRETARIAT
22 OCT 2024

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය
කොළඹ 12.

**<u>පොලිස් නිලධාරීන් අයථා ලෙස අවභාවිත කිරීමක් පිළිබඳව දැනුම් දීම.</u>**

නව රජයේ පත් වීමත් සමගම විශේෂයෙන් රජයේ නිලධාරීන් අවභාවිත කිරීම සම්පූර්ණයෙන්ම අත්හිටුවා ඇත. එහෙත් මහජන සේවය සඳහා සිටින පොලිස් නිලධාරීන් අයථා ලෙස අවභාවිත කිරීමක් පිළිබඳව පහත පරිදි වාර්තා කරමි.

01. සෑම අධිකරණ විනිසුරුවරයකුටම පුද්ගලික ආරක්ෂක නිලධාරියකු චක්‍ර ලේඛන මත ලබා දී ඇති අතර එහෙත් එම පොලිස් නිලධාරියා විනිසුරු ආරක්ෂක කටයුතු වල නොයෙදෙන අතර විනිසුරුවන්රුන්ගේ රියදුරු ලෙස රාජකාරි කරනු ලබන බව පෙන්වා දෙමි. විනිසුරුවරුන් හට රියදුරු සඳහා වැටුප ඔවුන්ගේ මාසික වැටුපට එකතුවන බව පෙන්වා දෙමි. ඉහත කරුණ සනාථ කල හැකි කරුණක් නම් ළමා අධිකරණ වල විනිසුරුවරුන් හා කම්කරු උසාවි වල විනිසුරුවරුන් ද පුද්ගලික ආරක්ෂක නිලධාරීන් ලබාගෙන ඇත. පුද්ගලික ආරක්ෂක නිලධාරීන් ලබා ගැනීමට ඔවුන්ට ඇති තර්ජනය කුමක්ද ?

02. මෙම සමීප ආරක්ෂක නිලධාරීන් විනිසුරුවරුන් විසින් තම ප්‍රතිරූපය නංවා ගැනීමට වෙළෙඳසැල් වලට ගොස් බඩු බාහිරාදිය අඩු මිලට ලබා ගැනීමට, රාත්‍රී කාලයේ සාද සඳහා ගොස් බීමත්ව පැමිණීමට සහය ලබා ගැනීම, තම නිවෙස් වල සුළු සුළු පෞද්ගලික කටයුතු සඳහා යොදා ගැනීම් සිදු කරනු ලබයි.

03. අධිකරණ භූමි වල ආරක්ෂාව සඳහා මුරකරුවන් බඳවාගෙන ඇත. එම මුරකරුවන් විනිසුරුවරුන්ගේ වෙනත් පුද්ගලික කටයුතු මෙන්ම විනිසුරුවරුන්ගේ නිවෙස්වල පුද්ගලික කටයුතු සඳහා යොදාගෙන ඇත. අධිකරණ භූමි වල ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් යෙදවා ඇති අතර එසේ යෙදවීමට පොලිස් නිලධාරීන් මුරකරුවන් නොවන බව පෙන්වා දෙමි.

04. අධිකරණයේ සිතාසි, වරෙන්තු හා නඩු ලේඛන ගත කිරීම සඳහා පොලිස් නිලධාරීන් යොදවා ගනු ලබන අතර අධිකරණ වල සිටින ලිපිකරුවන් හා සේවකයින් විනිසුරුවරුන් විසින් නිසි කළමණාකරණයක් නොකර එම රාජකාරි සඳහා අනිසි බලපෑම් කර පොලිස් නිලධාරීන් යොදවාගනු ලබයි.

05. විවිධ ශ්‍රේණියේ විනිසුරුවරුන් ගමන් කිරීම සඳහා පෙරගමන් යතුරුපැදි ලබාගෙන ඇති අතර ඔවුන්ට පෙර ගමන් යතුරුපැදි නොමැතිව ගමන් කල නොහැකි තත්වයට පත් වී ඇත. විනිසුරුවරුන් කලට වේලාවට අධිකරණවලට යාමට නම් කල් වේලා ඇතිව නිවසින් පිටත් පිටත්විය යුතු බව පෙන්වා දෙමි. අතිගරු ජනාධිපතිතුමා මෙන්ම ගරු අගමැතිණිය පවා පෙරගමන් යතුරුපැදි ලබා නොගන්නා සමයක මෙයද සොයා බැලිය යුතු කරුණකි.

06. සමහර රජයේ අධිනීතිඥ මහත්වරුන් ද තම කාර්යාලයට පොලිස් නිලධාරියකු ලබාගෙන ඇති අතර, ඔහු සම්බන්ධීකරණ නිලධාරියකු යැයි පවසා තම කාර්යාලීය කටයුතු පොලිස් නිලධාරීන් ලවා කරවා ගන්නා බව පෙන්වා දෙමි. ඔවුන්ට අවශ්‍ය තරම් කාර්ය මණ්ඩල නිලධාරීන් සිටියත් ඔවුන්ගේ පරිපාලන දුර්වලතා නිසා අධිකරණ නිලධාරීන් මෙහෙයවීම කළ නොහැකි බව පෙන්වා දෙමි.

07. සමහර විනිසුරුවරුන් නිල නිවෙස් ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් 4 දෙනෙකු ලබා ගෙන ඇති අතර, ඊට අමතරව දුර බැහැර විනිසුරුවරුන් ඔවුන් පදිංචි පුද්ගලික නිවෙස් වල ආරක්ෂාව සඳහා ද එම පොලිස් ස්ථාන මගින් ද නිලධාරීන් ලබාගෙන ඇත.

08. කොළඹට තදාසන්න ප්‍රදේශවල පිහිටි අධිකරණ සංකීර්ණ වල පොලිස් මුරපොළවල් පිහිටා ඇති අතර ඒ සඳහා අති විශාල පොලිස් නිලධරයන් ප්‍රමාණයක් යොදවා ඇති අතර විනිසුරුවරුන් අධිකරණ වලට පැමිණෙන විට මග දෙපස සිටින මිනිසුන් හා වාහන ද ඉවත් කල යුතු අවස්ථා ඉහත ප්‍රදේශවල සිදුවන බව කවුරුත් දන්නා කරුණකි.

09. සමහර අවස්ථා වලදී විනිසුරුවරුන්ට ආරක්ෂාව ලබා දීම සම්බන්ධයෙන් කතාබහක් ඇති වූයේ විනිසුරු සරත් අඹේපිටිය මහතා ඝාතනය කිරීමත් සමග වන අතර එක් සිදු වීමක් අලලා මෙලෙස අති විශාල පොලිස් නිලධාරීන් ප්‍රමාණයක් අවභාවිතා කිරීම පිළිබඳව සොයා බැලිය යුතුව ඇත.

10. ඉහත කරණ සම්බන්ධව පොලිස් නිලධාරීන් ලබා නොදෙන අවස්ථා වල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති ඇතුළු ප්‍රදේශයේ උසස් පොලිස් නිලධාරීන් චක්‍රාකාරයෙන් අධිකරණයට ගෙන්වා දෝශ දර්ශණයට ලක් කරන බව පෙන්වා දෙමි.

11. නීතිපති දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරීන් ද පොලිසියේ උසස් නිලධාරීන් කැඳවා ඔවුන්ට සිතැගි පරිදි අත්‍යවශ්‍ය නොවන කරුණු සඳහා ගෙන්වාගෙන සාකාච්ඡා වලට සහභාගි කරවනු ලබන බව පෙනී යයි. ශ්‍රී ලංකා පොලිසියේ අධිකරණ කටයුතුවල නියලීම පිළිබඳව පලපුරුද්දක් නොමැති සමහර උසස් නිලධාරීන් මේ ගැන හරිහැටි කරුණු නොදැන බියට පත් වී ඉහත හා පහළ සියළු නිලධාරීන් සමග නීතිපති කාර්යාලය වෙත පිටව යයි. නීතපති කාර්යාලය වෙත කැඳවිය යුත්තේ සාක්ෂි වලට අදාල නිලධාරීන් පමණක් වන බව නීතිපති කාර්යාලයේ නිලධාරීන් නොදන්නවා නොවිය හැක. ඔවුන් කල යුත්තේ යම් රාජකාරි අතපසුවීමක් වී ඇත්නම් ඒ සම්බන්ධව ලිපි ඉදිරිපත් කිරීමයි.

12. මහජනයාගේ විශ්වාසය දිනා ගැනීමට කටයුතු කරනාවනම් අප්‍රමාදව අධිකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ නම් තමාගේ ප්‍රතිරූපය නැංවීමට හා අරාක්ෂාවට මෙතරම් පොලිස් නිලධාරීන් ප්‍රමාණයක් අවශ්‍ය නැත. මෙම කටයුතු පිළිබඳව අවධානය යොමු නොකර මෙලෙස කටයුතු කිරීමට කොතරම් කල් ගත වේද ? මහජනයා මේ පිළිබඳව දරණ ආකල්පය පිළිබඳව සොයා බැලිය යුතු කාලය එළඹ ඇත.

13. තවද විනිසුරුවරුන් පොලිස් නිලධාරීන් සමග ගමන් කරන්නේ තමාට ආරක්ෂාවක් හා විශ්වාසයක් නොමැති බව පෙන්වා දෙන අතර, දැන උගත් සමාජය විසින් පොලිස් නිලධාරීන් පිරිවරා ගමන් කරනු ලබන්නේ සමාජයෙන් ආරක්ෂා විය යුතු අයහපත් චරිත ඇති පුද්ගලයන් බව පෙන්වා දෙන අතර පොලිස් නිලධාරීන් පිරිවරාගෙන යාම ලැජ්ජාවක් බව සිතිය යුතු කරුණකි.